දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2013 පරීක්ෂණය - 2015 මැයි/ජුනි
First Examination in Arts (External) 2013 – May/June 2015

සිංප්‍ර 1.1 - සිංහල භාෂා ප්‍රවේශය
SL 1.1 – Approach to the Sinhala Language

කාලය පැය තුන යි

**එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන**
**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.**

---

## I කොටස

01. "මිනිසා ක්‍රමානුකූලව භාෂාව හැසිරවීම, මානව ශිෂ්ටාචාරයේ සන්නිවේදන ශක්තිය පිළිබිඹු කරන්නකි." උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය හා එහි ක්‍රියාකාරීත්වය ඇසුරෙන් මේ අදහස විමසන්න.

02. නූතන මිශ්‍ර සිංහල හෝඩිය ලියා දක්වා, එහි ඇතුළත් කුමන අක්ෂර, සිදත් සඟරා හෝඩියෙහි දක්නට නො ලැබේදැයි පෙන්වා දෙමින් ඊට බල පෑ හේතු පහදන්න.

03. "නො පැනේ වහර වෙසෙසෙක් පුමඉතිරි ලිඟු දෙක විනා" යන සිදත් සඟරා මතය සැලකිල්ලට ගනිමින් සිංහලයේ නාමපද සම්බන්ධයෙන් පවත්නා ලිංගභේදය පිළිබඳ විචාරාත්මක රචනයක් ලියන්න.

04. පහත දැක්වෙන ව්‍යාකරණ මාතෘකාවලින් <u>හතරකට</u> ලුහුඬු විවරණ සපයන්න.
   1. ආදේශ සන්ධි
   2. අව්‍ය සමාසය
   3. ඝෝෂ හා අඝෝෂාක්ෂර
   4. කාරක සය
   5. ප්‍රයෝජ්‍ය ක්‍රියා
   6. අසම්භාව්‍ය ක්‍රියා
   7. ධාතු ප්‍රකෘති

## II කොටස

05. "දයින් නමින් හොත කරනුයේ පස නම්" යන පාඨයට අනුව ප්‍රත්‍ය යනු කුමක්දැයි හඳුන්වා, සිංහලයේ තද්ධිත ප්‍රත්‍යාර්ථ භාවිතය සනිදර්ශන ව විස්තර කරන්න.

06. "පාමොක් අත වෙසෙස් වණන පද වෙසෙසුන් නම්" භාෂා ව්‍යවහාරය සඳහා විශේෂණ හා විශේෂ්‍ය පද නාම ක්‍රියා විෂයයෙහි භාවිත වන අයුරු සනිදර්ශන ව පැහැදිලි කරන්න.

07. පහත සඳහන් වාක්‍යයන්හි අංකිත පදවලට අදාළ විභක්ත්‍යර්ථ පැහැදිලි කරන්න.

I. සතුන් අතුරෙන් මිනිසා උතුම් ය.
II. පැසුණු හිසින් බුහුමන් ලබව.
III. ඕ තොමෝ රජහට ප්‍රිය වන්නීය.
IV. මම සතියක් බෙහෙත් බීවෙමි.
V. නුඹ උන් කැටිව එක බසකුත් නො කියා.
VI. අපි තුවුසන් කෙරෙහි පැහැදුණෙමු.
VII. එය ඔහු අතින් වූ වරදකි.
VIII. ගොවියා පුතු මහෞෂධ පණ්ඩිතයා ය.
IX. අපි දූදනන් පිටු දකිමු.
X. තෙරණුවෝ උවසුවාහට දහම් දෙසත්.

08. පහත සඳහන් වාක්‍යයන්හි උපයුක්ත උක්තාඛ්‍යාත පද සම්බන්ධ රීති පැහැදිලි කරන්න.

I. ඒ මිනිස්සු ගොවියෝ වෙති.
II. ඇතැමෙක් මුසා බෙණෙති.
III. ජයදේවයෝ ගීත ගෝවින්ද කාව්‍යය කළහ.
IV. සතුරන් ආහ'යි ඔවුහු බිය වූහ.
V. මැණියන් දෑ දරුවන් සනසන දෑ ය.
VI. වෙදදුරා සිසුන් ලවා ලෙඩුන් බලවයි.
VII. ඇදුරුතුමා සිසුනට සිප් සතර දෙයි.
VIII. නායකයා නොහොත් අනුගාමිකයෝ එය සිදු කළහ.
IX. ඔවුන් එහි යතොත් අපි නොයමු.
X. මව විසින් දරුවෝ රක්නා ලදහ.

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගිනි)